## සම්මත සේවා ගිවිසුම

**මෙම** ගිවිසුම, ජාතික හැඳුනුම්පත් අංක/සමාගම් ලියාපදිංචිකිරීමේ අංක………………….. දරණ……………………………………………………………………………………….. සහඅංක 255, ගාළු පාර, කොළඹ 03 හි පිහිටි NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ් (සමාගම) විසින්……………දින අත්සන් තබන ලදී.

**අදාළ වන නෛතික විධිවිධාන**

1923 අංක 08 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත, 1937 අංක 7 දරණ ලියාපදිංචි කොටස් හා සුරැකුම් ආඥාපනත, 1923 අංක 08 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනතෙහි 16 වන වගන්තිය යටතේ සම්පාදිත 2009 අංක 01 දරණ දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික ගණුදෙනුකරුවන්) රෙගුලාසි සහ 1937 අංක 7 දරණ ලියාපදිංචි කොටස් හා සුරැකුම් ආඥා පනතෙහි 55 වන වගන්තිය යටතේ සම්පාදිත 2009 අංක 01 දරණ ලියාපදිංචි කොටස් හා සුරැකුම් රෙගුලාසි යන පනත් හා රෙගුලාසි වල විධිවිධාන ප්‍රකාරව.

**පොදු මූලධර්ම**

සමාගම එයට පැවරී ඇති අධිකාරී සීමාව තුල සිට, ගනුදෙනුකරුවන් සමග සිදුකෙරෙන සියළු ක්‍රියාකාරකම් වලට අදාළව,

(අ)එහි ගනුදෙනුකරුවන්ගේ අභිලාෂ සහ වෙළඳපල අඛණ්ඩතාවය සාක්ෂාත් කිරීමෙහිලා අවංකව, සාධාරණව සහ වෘත්තිය නිපුණතාවයෙන් යුතුව ක්‍රියාකරයි.

(ආ)එහි ගනුදෙනුකරුවන්ගේ අභිලාෂ මුදුන් පමුණුවාලීම සඳහා නිසි කුසලතාවයෙන්, පරීක්ෂාකාරීත්වයෙන් සහ උද්යෝගයෙන් යුතුව ක්‍රියාකරයි.

(ඇ)යම් ආයෝජනයක වාසි හෝ අවාසි පිළිබඳව අපරීක්ෂාකාරීව, නොසැලකිලිමත් ලෙස හෝ සිතාමතා ගනුදෙනුකරු නොමග යැවීමට කටයුතු නොකරයි.

(ඈ)ආයෝජනයට අදාළ තොරතුරු ගනුදෙනුකරුවන්ගෙන් අපේක්ෂා කරයි.

(ඉ) ගනුදෙනුකරු දැනුවත් කිරීම සඳහා සියළු ගාස්තු ඇතුළු අදාළ තොරතුරු සම්පූර්ණයෙන් අනාවරණය කරයි.

(ඊ) මත ගැටුම් වැළක්වීමට කටයුතු කරයි.

(උ)වේගවත්ව, කාර්යක්ෂමව හා සාධාරණව වැරදි නිවැරදි කිරීම හා ගනුදෙනුකරුවන්ගේ පැමිණිලි ආමන්ත්‍රණය කිරීම සිදුකරයි.

(ඌ)ගනුදෙනුකරු අනවශ්‍ය ලෙස පීඩාවට පත්කිරීම හෝ ඔහු/ඇය කෙරෙහි අනිසි බලපෑම් කිරීම සිදු නොකරයි.

(එ)යම් ආයෝජනයක් ඔස්සේ ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන් එම ආයෝජනයේ සන්නාමය වැරදිසහගත අදහසක් ඇතිනොකරන බව සහතිකකරයි.

(ඒ)ගනුදෙනුකරු විසින් ලබාදෙන ලද සියළු උපදෙස් ක්ෂණිකව හා නිසි පරිදි ඉටුකෙරෙන බව සහතිකකරයි.

(ඔ)යම් ගනුදෙනුකරුවෙකුගේ නමින් සමාගම වෙත ලැබුණු යම් මුදලක් එම මුදල ලද දින වැඩකරන කාල සීමාව අවසානයේ එම ගනුදෙනුකරුගේ ගිණුමට බැර කෙරෙන බව සහතික කරයි.

(ඕ) ඇටෝර්නි බලපත්‍රයක් යටතේ ගනුදෙනුකරුවෙක් වෙනුවෙන් කටයුතු කරන පුද්ගලයෙක් සමග සමාගම ගනුදෙනු කරන විට සමාගම;

- ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක් ලබාගනී.
- අදාළ ඇටෝර්නි බලපත්‍රය යටතේ එම පුද්ගලයාට ගනුදෙනුකරු වෙනුවෙන් කටයුතු කිරීමට අවස්ථාව සැලසෙන බව සහතික කරයි.
- ඇටෝර්නි බලපත්‍රයේ අන්තර්ගත සීමා තුල සිට කටයුතු කරයි.

**තොරතුරු හා අදාළ විධිවිධාන**

(අ)යම්හෙයකින් සමාගම සිය මෙහෙයුම් නවතාදැමීම, තවත් සමාගමක් සමග ඒකාබද්ධවීම හෝ එහි සියළු ක්‍රියාකාරකම් හෝ ඉන් කොටසක් තවත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු වෙත පැවරීම යන අවස්ථාවලදී සමාගම;

- විකල්ප ක්‍රමවේදයකට එළඹීමේ අවස්ථාව ලබාදෙමින් අවම වශයෙන් මාස දෙකකට පෙර ගනුදෙනුකරු ඒ පිළිබඳව දැනුවත් කරයි.
- සියළු අසම්පූර්ණ ගනුදෙනු පියවන බව සහතික කරයි. නැතහොත් පවරාදීමෙන් හෝ ඒකාබද්ධවීමෙන් පසු ගනුදෙනුවල අඛණ්ඩතාවය පිළිබඳව ගනුදෙනුකරු දැනුවත් කරයි.

(ආ) ගනුදෙනුකරු සමග විද්‍යුත් මාධ්‍යයක් ඔස්සේ සන්නිවේදනය කරන අවස්ථාවලදී ගනුදෙනුකරු වෙතින් ලබාගන්නා තොරතුරු වල ආරක්ෂාව සැලසීම සහ ගනුදෙනුකරු වෙත සුරක්ෂිතව තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා නිසි වැඩපිළිවෙලක් පවතිනබව සමාගම සහතික කරයි.

**ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු වෙත ගනුදෙනුකරුවෙකුගේ වගකීම**

ගනුදෙනුකරු ඕනෑම අවස්ථාවක සම්බන්ධ කරගැනීමට සහ සංයුක්ත තැටියේ අන්තර්ගත, ගනුදෙනුකරු ලියාපදිංචි කිරීමට අදාළ තොරතුරු කාලීන හා නිවැරදිබව තහවුරු කරගැනීමට හැකිවන පරිදි ගනුදෙනුකරු සිය ලිපිනයේ හෝ අනෙකුත් තොරතුරු වල සිදුවන ඕනෑම වෙනසක් පිළිබඳව සමාගම දැනුවත් කිරීමට කටයුතු කිරීම ඉතා වැදගත්වේ.

(අ)ගනුදෙනුකරු අදාළ ගිවිසුමට එළඹීමට  පෙර ප්‍රාථමික ගනුදෙනුකරු විසින් ලබාදෙනු ලබන නිමැවුම/සේවාව පිළිබඳව පූර්ණ අවබෝධයක් ඇතිකරගත යුතුය.

(අ) ගනුදෙනුකරු, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අදාළ අයදුම් පත්‍රය හා එහි සඳහන් කරුණු සනාථ කෙරෙන ලේඛණ සමාගම වෙත භාරදිය යුතුය.

**ගනුදෙනුකරුවන්ගේ ප්‍රඥප්තිය සමග අනුකූලවීම**

NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්,  එහි ගනුදෙනුකරුවන්ගේ අරක්ෂාව සහතික කිරීම සඳහා සම්පාදිත සිය ගනුදෙනුකරුවන්ගේ ප්‍රඥප්තිය විසින් පාලනය කෙරෙන බවටත් එම ප්‍රඥප්තිය ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cbsl.lk මගින් ප්‍රකාශයට පත්කර තිබෙන බවටත් සමාගම මෙයින් සහතික වෙයි.

සමාගමේ (NSB ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පනි ලිමිටඩ්) සම්මත සේවා ගිවිසුමෙහි පිටපතක් ලද බවට මම සහතික වෙමි.

……………………………… ………………………………………

අයදුම්කරුගේ අත්සන හවුල් අයදුම්කරුගේ අත්සන

දිනය ：

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.**

ගණුදෙනුකරුගෙ අංකයඃ …………………හඳුන්වාදෙන ලද්දේ ： ……………………පරීක්ෂා කළේඃ …………

ගණුදෙනුකරුගෙ අංකයඃ …………………ශාඛා අංකය ： ………………………… අනුමත කළේඃ …………